සැ.යු.: මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI වැනි කොටසේ 2026 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත්, අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,502 - 2026 අගෝස්තු මස 14 සිකුරාදා - 2026.08.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 සැප්තැම්බර් මස 04 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අගෝස්තු මස 21 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82820 - (2026/08)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ නීති නිලධාරී (විධායක නිලධාරී සේවා ගණයේ III වන ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025

විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ විධායක නිළධාරී සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 03 ක් පිරවීම සඳහා නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනය දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන යෝජ්‍යතා ඇගයීමේ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**2. අවශ්‍ය සුදුසුකම් :**

**I. අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

**II. පළපුරුද්ද :**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව නීතිඥවරයකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, සහතික කරන්නාගේ නිල මුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.)

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක *වසර තුන (03) කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානී විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු අතර, එම ලිපියෙ හි පළපුරුද්ද ලබා ගැනීමට අදාළ නීතිමය තනතුරට/ තනතුරුවලට* බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ද ඇතුළත් කර තිබිය යුතු ය.)

*සටහන :* මූලික සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය. සේවා කාලය ආරම්භවන හා අවසානවන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය.

**III. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හො මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**IV. වෙනත් :**

- ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, කායික සුදුසුකම් හා වයස අයදුම්පත් කැඳවන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

**4. වැටුප් පරිමාණය :**

මෙම තනතුරට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 10/2025 දරන වැටුප් චක්‍ර ලේඛනය අනුව SL1-2025 රු. 82,150 - 10 ×2,400 - 8 × 2,940 - 17×3,900 - රු. 195,970/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම ක්‍රමය පිළිබඳ රජය මගින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව, නියමිත රාජ්‍ය භාෂාවේ/රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කර ඇති අංක PSC/EST/5/1/24/2/2012 හා 2024.05.31 දිනැති විදේශ කටයුතු අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුර සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද කලින් කල රජය විසින් පනවනු ලබන චක්‍රලේඛ විධිවිධානවලටද මෙම පත්වීම යටත් වේ.

V. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**6. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු අංකය* | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| | (*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව වද්‍යාලයකින් ලබාගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | 25 |
| | (*ආ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (*ඇ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සබාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගන්නා ලද, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • දෙවන පන්තියේ පහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (*ඈ*) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | *සටහන* I : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ. | | |
| | *සටහන* II : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| 2 | **අතිරේක වෘත්තීය පළපුරුද්ද** | | 35 |
| | නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම | | |

<table>
<tr><th>අනු අංකය</th><th>ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td></td><td>
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>03</td><td>04</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>03</td><td>04</td></tr>
<tr><td>මහාධිකරණය/වාණිජ මහාධිකරණය/ සිවිල් අභියාචන මහාධිකරණ</td><td>02</td><td>02</td></tr>
<tr><td>දිසා /මහේස්ත්‍රාත් අධිකරණ</td><td>02</td><td>02</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>02</td><td>02</td></tr>
</table>
<br>
සටහන : ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු අතින්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවැති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.
</td><td></td><td></td></tr>
<tr><td>03</td><td>භාෂා ප්‍රවීණතාවය<br>(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව උපාධියක් ලබා තිබීම</td><td>15</td><td>15</td></tr>
<tr><td></td><td>(ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවලදී (Moot Court Competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br>කේවල<br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාවය - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br>කණ්ඩායම්<br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාවය - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06</td><td>12</td><td></td></tr>
<tr><td></td><td>(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1,500 ක පාඨමාලාවක් හදාරා ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක් ලබා තිබීම.</td><td>10</td><td></td></tr>
<tr><td></td><td>(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී හෝ Edexcel හෝ Cambridge උසස් පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කඳවන දිනට පූර්වාසන්න වසර 02 ක් ඇතුළත IELTS සමස්ථ ලකුණු 6.5 ක් (සෑම විෂයකටම අවම ලකුණු 06 ක් සහිතව) හෝ ඊට ඉහළ TOEFL-IBT ලකුණු 79 ක් හෝ ඊට පහළ TOEFL-CBT, ලකුණු 213 ක් හෝ ඊට ඉහළ හෝ TOERL-PBT ලකුණු 550 ක්හෝ ඊට ඉහළ ලබා තිබීම.</td><td>08</td><td></td></tr>
</table>

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>*සටහන :* ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |
| 4 | **තොරතුරු තාක්ෂණය පළිබඳ දැනුම**<br>(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහමා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම.<br>(ආ) විශ්ව වද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබව ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>(ඇ) විශ්ව වද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br>***සටහන :*** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | <br>10<br>08<br>05<br>04 | **10** |
| 5 | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය**<br>තනතුරෙහි භූමිකාව ඉටු කිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ<br>❖ සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>❖ නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම<br>❖ පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය<br>ඇගයීමට ලක් කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | <br><br>05<br>05<br>05 | **15** |
| **එකතුව** | | | **100** |

7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

❖ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

❖ සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකපත්වල මුල් පිටපත් හා අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

❖ සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

(i) අයදුම්පත් 2026.09.14 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පුටුව 1 සිට 3 දක්වාත්, දෙවැනි පිටුව 4 සිට 8 දක්වාත්, තෙවැනි පිටුව 9 සිට 11 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දනර අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

9. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
විදේශ කටයුතු, විදේශ
රැකියා සහ සංචාරක අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස .... දින,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01,

**ආදර්ශ අයදුම්පත**

විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ නීති නිලධාරි (විධායක නිලධාරි සේවා ගණයේ III වන ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4) ☐

**සටහන :** අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ...........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) : ...........................................................................................................

1.2 සම්පූර්ණ නම :...........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................................................................

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය): ...........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) උදා : **කේ. එම්. ටී. බාලසූරිය (මයා/මිය/මෙය).**

1.4 මුලකුරු සමග නම : ...........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0 2.1 ස්ථිර ලිපිනය : ...........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය : ...........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය: (පුරුෂ - 0, ස්ත්‍රී - 1) ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2) ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය: වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.4 2026.09.14 දිනට වයස: අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 දුරකථන අංකය : *ස්ථාවර :* ☐☐☐☐☐☐☐☐☐☐

*ජංගම :* ☐☐☐☐☐☐☐☐☐☐

5.0 අධ්‍යාපන සුදුසුකම් :

- 5.1 උපාධිය ලබාගත් ආයතනය ලබාගත් දිනය

| උපාධිය | ලබාගත් ආයතනය | ලබාගත් දිනය |
|---|---|---|
| ........................... | .................................. | ................................. |
| ........................... | .................................. | ................................. |

6.0 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය: ....................

6.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර 03 ක වශයෙන් පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය: ....................
6.2 රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කළ දිනය: .......................

* මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

7.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :-

7.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම්: ..........................................................................................................................
..........................................................................................................................

7.2 අතිරේක වෘත්තීය පළපුරුද්ද: ..........................................................................................................................
..........................................................................................................................

7.3 භාෂා ප්‍රවීණතාවය : ..........................................................................................................................
..........................................................................................................................

7.4 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම: ..........................................................................................................................
..........................................................................................................................

8.0 ඔබ උසාවියකින් වරදකරු කරනු ලබා තිබේද? (ඔව් / නැත)
(ඔව් නම් විස්තර කරන්න)
..........................................................................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

................................ ................................................,
දිනය. අයදුම්කරුගේ අත්සන.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................................මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම
තනතුර:
දිනය:
(නිල මුද්‍රාව තබන්න)

11.0 දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශය (රාජ්‍ය සේවයේ නියුක්තිකයින් සඳහා පමණි)

ඉහත විස්තර සඳහන් ............................................................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.........................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව තබන්න)

08 - 159

---

**ශ්‍රී ලංකා පොලීසිය**

ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් සහයක සේවාවට අයත් තනතුරුවලට අයදුම්පත් කැඳවීම.

2026.07.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* අංක 2497 හි 1 වන කොටස (II අ) වැනි කොටසේ පල කිරීම් මාතෘකාව යටතේ පිටු අංක 15 සිට 37 දක්වා පළ කල දැන්වීමෙහි අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.09.14 දින දක්වා දීර්ඝ කරමි.

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

2026 අගෝස්තු මස 06 දින,
කොළඹ - 02,
පොලිස් මූලස්ථානයේ දී ය.

08 - 199

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (II) 2025**

අංක 2,468 හා 2025.10.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද "සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (II)" විභාග නිවේදනයේ 5.0 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

5.0 මෙම විභාගය සඳහා අයදුම් කිරීම මාර්ගගත (online) ක්‍රමවේදය ඔස්සේ සිදු කළ යුතු ය. ඒ සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිස "Apply for Examinations" දිගුව භාවිතයෙන් නවක අයදුම්කරුවන්ට අදාළ විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැකිය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2026 සැප්තැම්බර් මස 04 වන දින දක්වා දීර්ඝ කරනු ලබන අතර විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම 2026.08.15 දින පෙ.ව. 8.00 සිට 2026.09.04 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක. මෙම විභාගය 2026 නොවැම්බර් මස දී පැවැත්වීමට කටයුතු කෙරේ.**

තවද, මින් පෙර මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන්ට සෘජුව https://examinationportal.slida.lk/app/applied-exams දිගුව ඔස්සේ පද්ධතිය වෙත පිවිස, තමන් විසින් සකස් කරගත් පරිශීලක ගිණුම (User Account) භාවිත කර ඉදිරිපත් කරන ලද අයදුම්පතේ තත්ත්වය (Application Status) පිළිබඳව තොරතුරු ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

එහි දී අයදුම්පතෙහි තත්ත්වය පහත පරිදි අර්ථ දැක්වේ :

I. Approved - අයදුම්පත අනුමත කර ඇති බැවින් තවදුරටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නොවේ.

II. Draft - අයදුම්පතෙහි පවතින අඩුපාඩු හෝ අසම්පූර්ණ තොරතුරු සංශෝධනය කර නැවත ඉදිරිපත් (Submit) කළ යුතු ය.

III. Reject - අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇති අතර, පද්ධතියෙහි සඳහන් හේතු අනුව,

(*a.*) මුදල් ගෙවීම් සම්බන්ධ ගැටළු - නිවැරදි ගෙවීම් පිළිබඳ තහවුරුවක් (ගෙවීම් ලදු පතෙහි ඡායාරූපක්) doeb2025@slida.gov.lk වෙත විෂයය (Subject) ලෙස නම හා පත්වීම් අංකය (උදා - ඒ. බී. සී. ඩී. පෙරේරා - CS/DOS/00001) සඳහන් කොට ඊ-මේල් පණිවුඩයක් මගින් ඉදිරිපත් කිරීම.

(*b.*) වැරදි විභාගය තෝරා ඉදිරිපත් කරන ලද අයදුම්පත් - නැවත නිවැරදි විභාගය තෝරා නව අයදුම්පතක් පෙර මුදල් ගෙවූ කුවිතාන්සිය සමග ඉදිරිපත් කළ යුතු ය. (උදා - සංවර්ධන නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරින් III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද, සංවර්ධන නිලධාරි සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරින් II කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද, සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය)

(*c.*) උසස්වීම් සම්බන්ධ ගැටළු - අදාළ උසස්වීම් නොලද නිලධාරින් රා.සේ.කො. චක්‍රලේඛ අංක 02/2023 යටතේ ඉල්ලුම් කළ නොහැක.

මෙම නව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ දී සිදුවන තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-4513368 හා 011-4513366 යන දුරකතන අංක ඔස්සේ විමසීම් සිදු කළ හැක.
මීට අමතරව විභාගය සම්බන්ධ අනෙකුත් ගැටලු සම්බන්ධයෙන් පහත දුරකතන අංකවලට අමතා ඔබගේ ගැටළු ඉදිරිපත් කරන්න.

පත්වීම් අංක CS/DOS/00001 - CS/DOS/52500 හා CS/DOS/A/90000 ට වැඩි : 011-2673560
(2020.01.01 දින හා ඊට පසු බඳවාගත් සංවර්ධන නිලධාරින්)
පත්වීම් අංක CS/DOS/52501 - CS/DOS/A/90000 : 011-2684223
(2020.01.01 දින හා ඊට පසු බඳවාගත් සංවර්ධන නිලධාරින්)

02. අංක 2,458 හා 2025.10.10 දිනැති *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන නොවෙනස්ව බලපැවැත්වෙන අතර අයදුම්පතේ තත්ත්වය (Application Status) Approved නිලධාරින් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය නොවන බව නිවේදනය කරනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

2026, ජූලි මස 31 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 104

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ගමනාගමන පිරිවැය නිලධාරි - III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ගමනාගමන පිරිවැය නිලධාරි - III ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ගමනාගමන පිරිවැය නිලධාරි - III ශ්‍රේණිය සඳහා වේ.

1.2 අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.09.14 වේ.

*සටහන :-* අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතු ය.

*ලිඛිත විභාගය :*

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

i. බුද්ධි පරීක්ෂණය;
ii. පිරිවැය හා සංඛ්‍යානය.

*විභාග දිනය .-* මෙම විභාගය 2026 සැප්තැම්බර් මස දී පැවැත්වෙනවා ඇත. එකී විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරිට බලය ඇත.

**02.** පත් කරනු ලබන සංඛ්‍යාව 02කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 91 වැනි වගන්තියේ ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**03.** ***සේවා කොන්දේසි :***

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/02/2015 හා 2016.04.19 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද ආයතන

සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද, අංක 2310/29 හා 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලටද, යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු ය.

3.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගමනාගමන පිරිවැය නිලධාරී III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියෙහි සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය ඇත.

**04.** ***මාසික වැටුප් පරිමාණය :***

2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 53,060/= - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 5 x 1,350 - 94,100/= (MN 4 - 2025) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උප ලේඛනයේ III හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට දෙනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

**05.** ***බඳවා ගැනීමේ සුදුසුකම් / පළපුරුද්ද :***

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.

iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ්‍ය, ව්‍යාපාර කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, පිරිවැය කළමනාකරණය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii.) පිළිගත් විශ්ව විද්‍යාලයක ඕනෑම විෂය ධාරාවකින් ලැබූ උපාධියක් සමග පිරිවැය කළමනාකරණය පිළිබඳ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.

*සටහන .-* උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

*වයස :*

අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසි එකට (21) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස්පහට (35) නොවැඩි විය යුතු ය.

*වෙනත් :*

i. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* වෙබ් අඩවියේ සඳහන් කර ඇති අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

ii. කුමන හෝ ආගමක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

**06.** ***විභාග ගාස්තු :***

විභාග ගාස්තුව රුපියල් 1,200.00කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ, මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-090-27314 ට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**07. අයදුම් කිරීමේ ක්‍රමය :**

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමු වන පිටුවටද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවන පිටුවටද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත්ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර, ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද? යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත් වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.24 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගමනාගමන පිරිවැය නිලධාරී - III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

**දුම්රිය සාමාන්‍යාධිකාරී,**
**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 355,**
**ඕල්කට් මාවත,**
**කොළඹ 10.**

(ඈ) අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 71,240.00 කට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ www.railway.gov.lk යන වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ෆැක්ස් මඟින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ වට්ස්ඇප් (Whatsapp) අංකයක්ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තවද, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**08. *විභාගයට ඇතුළුවීම :***

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනය සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත දුම්රිය සාමාන්‍යාධිකාරී විසින්

ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවෙකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශපත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතු ය. සෑම අයදුම්කරුවෙකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

***සටහන .-*** අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**09.** ***අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය :***

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය.

**10.** ***සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :***

අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

**11.** මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**12.** ***විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :***

(*අ*) විභාගය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(*ආ*) අයදුම්කරු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතු ය.

(*ඇ*) අයදුම්කරුවෙකු සුදුසුකම්ලත් උපාධියේ විෂයයන් හා භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේදී ඔහු සමත් වූ විෂයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(*ඈ*) ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත් අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අයදුම්කරුවකු ප්‍රධාන විෂය සමත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන .-*

i. ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම්ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 (අ) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.
ii. අයදුම්කරුවෙකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
iii. තම අයදුම්පතෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවෙකුට ඉඩ දෙනු නොලැබේ.

**13.** ***බඳවා ගැනීමේ ක්‍රමය :***

13.1 *ලිඛිත විභාගය :*

පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුතු ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයන් සහ එක් එක් විෂය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 02. පිරිවැය හා සංඛ්‍යානය | 100 | 40 |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

*ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :*

01. බුද්ධි පරීක්ෂණය
අයදුම්කරුගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය කුසලතාව පරීක්ෂා කිරීමට

හැකිවන අයුරින් සකස් කරන ලද බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය (කාලය පැය 01 යි).

02. පිරිවැය හා සංඛ්‍යානය:

අයදුම්කරුගේ,

(i.) කළමනාකරණ තීරණ ගැනීමේ දී පිරිවැය ක්‍රම උපයෝගී කර ගැනීම.
(ii.) ද්‍රව්‍ය ශ්‍රම හා පොදු කාර්ය පිරිවැය හඳුනාගැනීම.
(iii.) විශ්ලේෂණය කිරීම.
(iv.) විචල්‍ය පිරිවැය, ස්ථාවර පිරිවැය, සෘජු හා වක්‍ර පිරිවැය, දිගු කාලීන හා කෙටි කාලීන පිරිවැය, ආර්ථික පිරිවැය ආදී පිරිවැය ක්‍රම හා පිරිවැය සිද්ධාන්ත උපයෝගී කර ගැනීම.
(v.) කළමනාකරණ තීරණ ගැනීමට හා පිරිවැය හා මූල්‍ය විශ්ලේෂණය සඳහා සංඛ්‍යානමය තොරතුරු සැපයීම.
(vi.) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා සංඛ්‍යානමය පුරෝකථනයන් කිරීම පිළිබඳ දැනුම පිරික්සීම සඳහා වූ කෙටි පිළිතුරු සැපයීම හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය (කාලය පැය 03යි).

13.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

(i.) ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කර එයින් වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

(ii.) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත්කරනු ලබන අතර එම පරීක්ෂණය පැවැත්වෙන දිනය දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත.

(iii.) එහි දී ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ පහත පරිදි වේ.

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 |
| 02 | වෘත්තීය සුදුසුකම් | 20 |
| 03 | පළපුරුද්ද | 25 |
| 04 | තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 20 |
| 05 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 20 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 05 |
| | **මුළු ලකුණු** | **100** |

***සටහන* -** පළපුරුද්ද යටතේ ලකුණු ලබාදීමේ දී 5 (අ) (ii) යටතේ දක්වා ඇති සුදුසුකම් මත බඳවා ගන්නා විටදී, බඳවා ගැනීම සඳහා සලකා බලන ලද වසර 02ට අමතර පළපුරුද්දක් සඳහා පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබයි. එම පළපුරුද්ද සලකා බලනු ලබන්නේ අයදුම්පත් කැඳවන අවසන් දිනට පෙර කාල පරිච්ඡේදය සඳහා වේ.

*සැලකිය යුතු යි :-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**14.** විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.railway.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

**15.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 ජූලි මස 29 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ගමනාගමන පිරිවැය නිලධාරි - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

**Open Competitive Examination for Recruitment to Transport Costing Officer Grade - III In Sri Lanka Railway Department - 2026**

1.0 මාධ්‍යය -

විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........................................................................................................
..........................................................................................................................................................

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA KARUNARATHNE)

2.2 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................................
..........................................................................................................................................................

(උදා: KARUNARATHNE, H.M.S.K)

2.3 මුලකුරු සමග නම : ..........................................................................................................

(උදා: KARUNARATHNE, H.M.S.K)

2.4 මුලකුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................................

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................................
..................................................................... (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.6 ස්ත්‍රී / පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) : ☐

ස්ත්‍රී - 1

පුරුෂ - 0

2.7 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.8 විවාහක/ අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ ලියන්න) : ☐

විවාහක - 1

අවිවාහක - 2

2.9 ජන වර්ගය (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) : ☐

2.10 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2.11 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

2.12 ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |
(WhatsApp Number)

3.0 උපාධිය ලද දිනය : ..........................................................................................................................................
විශ්වවිද්‍යාලය/ ආයතනය : ..........................................................................................................................
ලියාපදිංචි අංකය : ...................................................................................................................................
අභ්‍යන්තර / බාහිර : .................................................................................................................................
උපාධිය : .................................................................................................................................................
විෂයයන් : ...............................................................................................................................................
පන්තිය : .................................................................................................................................................
ඉහළ/ පහළ : ...........................................................................................................................................
උපාධිය වලංගු දිනය : .............................................................................................................................
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : .........................................................................................................

4.0 විභාග ගාස්තු ගෙවීම :
i. ගෙවන ලද මහජන බැංකු ශාඛාව : ...........................................................................................................
ii. ගෙවූ මුදල : .........................................................................................................................................
iii. ගෙවූ දිනය : ........................................................................................................................................

| මුදල් තැන්පතු පත්‍රිකාවේ (මුල් පිටපත) මෙහි අලවන්න.<br>(මුදල් තැන්පතු පත්‍රිකාවේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.) |
|---|

**5.0. අයදුම්කරුගේ සහතිකය -**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

................................ ............................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

**6.0. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 7(ඇ) පරිදි විය යුතු ය) -**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ................................ දින ඔහුගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

දිනය.................................. ........................................,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**7.0.** ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................ මයා/මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ........................................................................................ ලෙස සේවය කරන අතර ඔහුගේ/ ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි ය.

......................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ..........................................................
තනතුර : ......................................................
ලිපිනය : ......................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08 - 120

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026

**ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය**

2024 හා 2025 වසරවලට නියමිත කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 නොවැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. විභාග මධ්‍යස්ථාන :- උපලේඛනය 01හි දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

3. භාෂා මාධ්‍යය :- මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි.

4. සුදුසුකම් :- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

4.1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබීම;

4.2 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන ධර්මාචාර්ය විභාගය හෝ ධර්මාචාර්ය විශේෂ විභාගය හෝ ධර්මාචාර්ය ගෞරව විභාගය හෝ සමත් වී තිබීම;

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස (උ.පෙළ) විභාගයේ ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය යන විෂයයන් දෙකෙන් එකක් ද ඇතුළුව විෂයයන් තුනකින් සමත් වී තිබීම;

4.4 කතෝලික ධර්මය විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගයේ විෂයයන් 06කින් සමත් වීම හෝ කතෝලික ධර්මය විෂයය සඳහා සම්මාන සාමර්ථ්‍යක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගය හෝ සමත් ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කතෝලික දහම් පාසලක වසරකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ආචාර්යවරයකු වීම.

***සටහන :-*** මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම්වලින් එකක්වත් ලබා ඇති බවට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කතෝලික දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ මීසම් භාර පූජා ප්‍රසාදිතුමකු හෝ විසින් සහතික කොට අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය.

5. අයදුම් කිරීම :

5.1 ලියාපදිංචි දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් තැපැල් මගින් මේ වන විට දහම් පාසල් වෙත යොමු කර ඇති අතර, www.donets.lk වෙබ් අඩවිය මගින් ද බාගත කර ගැනීමේ පහසුකම සලසා ඇත.

5.2 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දී ඇත.

5.3 අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර, ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු ය. දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

5.5 අයදුම්කරුවන්ගේ අදාළ සුදුසුකම් ලබා තිබීම පිළිබඳව අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා හෝ පූජා ප්‍රසාදිතුමා හෝ වගකිව යුතු ය.

5.6 2026 සැප්තැම්බර් මස 14 වන දින අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන අතර, එදිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු වේ.

6. විභාග ගාස්තු : මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200/-කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට අයදුම් කරන විෂයය සඳහා විභාග ගාස්තුව රු. 50/-කි.

6.1 විභාග ගාස්තු ගෙවීම : අදාළ දහම් පාසලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලුම අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු එකතු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා එක් ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතු ය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

7. ප්‍රවේශ පත්‍ර : විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මීසම් භාර පූජා ප්‍රසාදිතුමා හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ රිසිට්පතේ ඡායා පිටපතක් සහිතව පහත සඳහන් විස්තර සැපයිය යුතු ය :-

1. විභාගයේ නම :
2. දහම් පාසලේ නම :
3. දහම් පාසලේ ලිපිනය :
4. දහම් පාසලට ලබාදී ඇති පරිගණක අංකය :
5. අයදුම්කරුගේ සම්පූර්ණ නම :
6. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :

8. අනන්‍යතාව : විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ :-

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

9. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන පහක් වන අතර, විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් පහම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි විභාග අවස්ථා තුනක් (3) ඇතුළත දී එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයයට පමණි.

9.2 සෑම විෂයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :-

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.3 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මඟින් එවනු ලැබේ.

10. සහතික පත්‍ර : මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම විභාග දෙපාර්තමේන්තුව මඟින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මඟින් ලබා දෙනු ඇත. උක්ත විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මඟින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලිපියක් මඟින් විමසීම් කළ යුතු ය.

11. උත්තර පත්‍ර නැවත සමීක්ෂණය : දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් විභාග ප්‍රතිඵල නිකුත් වී දින 14ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

12. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර පහකින් (5) සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනක් (3) බැගින් වේ. එම ප්‍රශ්න පත්‍ර පහත දැක්වේ :-

1. ශුද්ධ බයිබලය;
2. ජන වන්දනාව හා දේව ප්‍රසාද නිධාන;
3. සභා ඉතිහාසය (ලෝක හා ලංකා සභා ඉතිහාසය);
4. ධර්මෝපදේශය;
5. සභාවේ සමාජ දර්ශනය (සභා ඉගැන්වීම).

13. ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :-

- එක් එක් ප්‍රශ්න පත්‍රය I වැනි කොටස, II වැනි කොටස හා III වැනි කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- I වැනි කොටස කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10කින් සමන්විත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් ප්‍රශ්නයට ලකුණු හතර (4) බැගින් හිමි වේ. (ලකුණු 4 × 10 = 40)
- II වැනි කොටස ව්‍යුහගත ප්‍රශ්න පහකින් සමන්විත වේ. ඉන් කැමැති ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් හිමි වේ. (ලකුණු 12 × 4 = 48)

- III වැනි කොටස සඳහා රචනා වර්ගයේ ප්‍රශ්න දෙකක් (2) අඩංගු වේ. ඉන් කැමති එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටස සඳහා ලකුණු 12ක් හිමි වේ. (ලකුණු 12 × 1 = 12)

14. විෂය නිර්දේශය සහ මූලාකෘති ප්‍රශ්න පත්‍ර : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය සහ මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා "අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය, බැල්කම් පෙදෙස, කොටා පාර, කොළඹ 08." යන ලිපිනයෙන් හෝ 0112685459 විමසන්න.

15. මෙම ව්‍යවස්ථාව සහ විෂය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

2026 අගෝස්තු 14 වන දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය 01

| *දිස්ත්‍රික්ක / නගර අංකය* | *දිස්ත්‍රික්ක / නගර* |
|---|---|
| **01** | කොළඹ |
| **02** | ගම්පහ |
| **03** | කළුතර |
| **04** | මහනුවර |
| **05** | මාතලේ |
| **06** | නුවරඑළිය |
| **07** | ගාල්ල |
| **08** | මාතර |
| **09** | හම්බන්තොට |
| **10** | යාපනය |
| **11** | මන්නාරම |
| **12** | වව්නියා |
| **13** | මුලතිව් |
| **14** | කිලිනොච්චිය |
| **15** | මඩකලපුව |
| **16** | අම්පාර |
| **17** | ත්‍රිකුණාමලය |
| **18** | කුරුණෑගල |
| **19** | පුත්තලම |
| **20** | අනුරාධපුරය |
| **21** | පොළොන්නරුව |
| **22** | බදුල්ල |
| **23** | මොනරාගල |
| **24** | රත්නපුර |
| **25** | කෑගල්ල |

08 - 200